(c) www.sinhalalyrics.com

සීතල පොළොවම සිරි යහනක් වේවා
ගෝනි පඩංගුව මුදු පලසක් වේවා
පේලර මහතුන් නෑදෑයෝ වේවා
තැටියේ බත් පත දිව බොජුනක් වේවා

මා මුර ගෑවේ පිහිටක් අයදින්වයි
ධන වැද්දෙකුගෙන් බඹසර රැකගන්වයි
ඔබ දිව ආයේ මා දිවි ගලවන්නයි
අවි එසවූයේ යුක්තිය විසඳන්නයි

දිළිඳු ළඳුන්ගේ කුමරි දිවිය උන්ගේ
කාසිය උන්ගේ ලොකු ලොකු උන් උන්ගේ
පොලිසිය උන්ගේ කූඩුව අපේ උන්ගේ
නීතිය උන්ගේ හිරබත අපෙ උන්ගේ

තුලාව ගෙන නෙත් යුග බැඳ රෙදි කඩකින්
නීතියේ යුවතිය වැජඹෙයි අද නිදුකින්
ඔබ වන් මිනිසුන් වෙනුවෙන් ඇන සැතකින්
මරා දමමි ඇය මරා දමමි සැණෙකින්

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - ඔස්ටින් මුණසිංහ